# සා/පෙළින් රටම දිනුවෝ

## දිවයිනෙන්ම සාපෙළ පළමු වැනියා ගාල්ල සංඝමිත්තා බාලිකාවේ හිරුණි මල්ෂා කුමාරතුංග



**ගාල්ල දිසා සමූහ - නන්දසිරි වැලිගමගේ සහ ඉමදුව සමූහ ලංකින්ද නානායක්කාර**

මෙවර සාමාන්‍ය පෙළ විභාගයෙන් දිවයිනෙන්ම ප්‍රථම ස්ථානය දිනාගැනීමට ගාල්ල සංඝමිත්තා බාලිකා විදුහලේ හිරුණි මල්ෂා කුමාරතුංග සිසුවිය සමත්ව සිටින්නීය.

හිරුණි ඉංග්‍රීසි මාධ්‍යයෙන් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට මේ ජයග්‍රහණය ලැබුවාය. මේ ජයග්‍රහණය පිළිබඳ හිරුණි මෙලෙස අදහස් දැක්වූවාය.



"මගේ නංගි බුද්ධිනි මලීෂා කුමාරතුංග මගේ නිවුන් සහෝදරිය. නංගිත් එක්ක තමයි අධ්‍යාපන කටයුතුවල නිරත වුණේ. අපි දෙදෙනා එකට පාඩම් කළා. නංගියි මමයි පළමු වසරේ ඉඳලා සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ තමයි ඉගෙන ගත්තේ. නංගිත් විෂයයන් නවයටම ඒ සාමාර්ථය ලබා ගෙන විශිෂ්ට ලෙස සමත්ව තිබෙනවා. අපි දෙදෙනා නිදිමරාගෙන පාඩම් කළේ නෑ. රෑ 9.30 වන විට නින්දට ගියා. උදෑසන 5.00ට පමණ අවදි වෙලා පාඩම් කළා. පාසලේ එදිනෙදා පාඩම් වැඩ එදිනෙදාම අවසන් කළා.

යම්කිසි සැලසුමකට අනුව අධ්‍යාපන කටයුතුවල නිරත වුණා. අතිරේක විෂයයන් වශයෙන් දෙමළ, ඉතිහාසය, තාක්ෂණික විෂයයන් තමයි කළේ. ඇත්තටම විභාගයට ඉතා සැහැල්ලුවෙන් මුහුණදුන්නා. පාසලේදී හොඳින් අධ්‍යාපන කටයුතුවල නිරත වුණා. ගුරුවරුන් පාසලේ උගන්වන වෙලාවට හොඳින් අහගෙන හිටියා. පාසලේ බාහිර වැඩත් කළා. මාධ්‍ය සංගමය, පාසලේ විවාද කණ්ඩායම නියෝජනය කළා. විද්‍යා අංශයෙන් උසස් පෙළ විභාගයට පෙනී සිට වෛද්‍යවරියක් වීම තමයි මගේ අනාගත බලාපොරොත්තුව.

මේ ජයග්‍රහණය ගැන ගොඩක් සතුටුයි. මගේ අම්මට සහ තාත්තට ගොඩක් ස්තූතිවන්ත වෙනවා. මගේ පාසලේ ගුරුවරුන්, හිටපු විදුහල්පතිනිය වන චාන්දනී උඩුකුඹුර, වත්මන් විදුහල්පතිනිය වන අසේනි පරණවිතාන මහත්මීන්, මඟපෙන්වූ සියලුම ගුරු භවතුන්, 11 වසරේ පන්තිභාර ගුරුතුමිය වන ඩිලිනි වීරක්කොඩි ගුරුතුමිය මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෙ."

හිරුණිගේ පියා වන ටී. එච්. පුන්සිරි කුමාරතුංග මහතා ලංගම උඩුගම ඩිපෝවේ සේවය කරයි. මව එම්. කේ. ජී. කුමාරි ගාල්ල කළේගාන පියතිස්ස විද්‍යාලයේ ගුරුවරියකි. මොවුන් ගාල්ල, හපුගල ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර දැනට දියණියන් දෙදෙනාගේ අධ්‍යාපන කටයුතු පහසුවෙන් කරගෙන යෑමට ගාල්ල සංඝමිත්තා බාලිකා විද්‍යාලය අසල කුලී නිවෙසක පදිංචිව සිටිති.

තම පාසල ලැබූ මේ ජයග්‍රහණ පිළිබඳව ගාල්ල සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනි අසේනි පරණවිතාන මහත්මිය මෙලෙස අදහස් දැක්වූවාය.

"අපේ පාසලේ සිසුවියන් දෙදෙනකු මෙවර සාමාන්‍ය පෙළ විභාගයෙන් සමස්ත ලංකා ජයග්‍රහණ දෙකක් හිමි කරගෙන තිබෙනවා. හිරුණි මල්ෂා කුමාරතුංග දියණිය දිවයිනෙන්ම පළමු ස්ථානය හිමි කරගෙන තිබෙනවා. නදුනි සමුදිතා රණවීර දියණිය දිවයිනෙන්ම සිව් වැනි ස්ථානය හිමි කරගෙන තිබෙනවා. ඇත්තටම මේ දියණියන් දෙදෙනා පාසලට කීර්තියක් ලබාදී තිබෙනවා."

## දිවයිනෙන්ම දෙවැනි ස්ථාන 2ක් කුරුණෑගල මලියදේව බාලිකාවේ විමංසා ජයනදී





**කුරුණෑගල අතිරේක පුෂ්පකුමාර ජයරත්න**

කුරුණෑගල මලියදේව බාලිකා විදුහලේ විමංසා ජයනදී රත්නවීර සිසුවිය මෙවර අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් දිවයිනේම දෙවැනි ස්ථානය හිමි කරගෙන තිබේ.

ඇය සමඟ විභාගයට පෙනී සිටි නිවුන් සොයුරිය වන ජයනි ගිම්හානී රත්නවීර සිසුවිය ද ඒ සාමාර්ථය 9ක් හිමි කරගෙන ඇත.

වාරියපොළ පදිංචි ඔවුන් දෙදෙනාම වාරියපොළ ශ්‍රී සුමංගල ආදර්ශ විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් උසස් ලෙස සමත්ව වැඩිදුර අධ්‍යාපනය සඳහා මලියදේව බාලිකා විද්‍යාලයට ඇතුළත්ව ඇත. පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් විමංසා ලකුණු 95ක් ලබා ගත් අතර, නිවුන් නැඟණිය වූ ජයනි ලකුණු 94ක් ලබා ගත්තාය.

විමන්සා බාහිර ක්‍රියාකාරකම්වලට ද දක්ෂතාවක් දැක්වූ අතර, ඇය මේ වසරේ සමස්ත ලංකා පාසල් සමාජ විද්‍යා තරගාවලියේදී දිවයිනේ ප්‍රථම ස්ථානය දිනාගැනීමට ද සමත් වූවාය. එසේම ඇය ඔලිම්පියාඩ් තරගවලට ද සහභාගිවී ජයග්‍රහණ හිමි කර ගත් සිසුවියකි. මොවුන්ගේ පියා සෞඛ්‍ය සේවයේ නිරතව සිට විශ්‍රාම ලබා ඇති අතර මව රැකියාවක් නොකරයි.

මේ ජයග්‍රහණය පිළිබඳව විමංසා මෙලෙස පැවසුවාය.

"පවුලටම ඉන්නේ අපි දෙන්නා විතරක් නිසා කුඩා කාලයේ ඉඳ-

## කොළඹ මියුසියස් විද්‍යාලයේ කුළුණි මෙත්සරා



ලාම අපි දෙන්නා ගොඩක් සමීපව හිටියා. පාඩම් වැඩ කළේ, සෙල්ලම් කළේ, ගමන් ගියේ, කෑවේ බීවේ එකටමයි. හැම විභාගයකටම අපි දෙන්නා එකට එකතු වෙලා පාඩම් කළා. දෙන්නාටම විභාග ගැටලුවක් ආවාම දෙන්නාම එකතු වෙලා ඒවා විසඳන්න උත්සාහ කළා. මේ නිසා ඉගෙනුම් කටයුතු ඉතාම පහසුවෙන් කරගැනීමට අපි දෙන්නටම පුළුවන් වුණා.

මට වගේම නංගිටත් ඒ සාමාර්ථ නවයක් ලැබීම ගැන හරිම සතුටුයි. දැන් අපි දෙන්නාගේම උත්සාහය උසස් පෙළට ජීව විද්‍යා විෂයයන් හදාරා අනාගතයේදී වෛද්‍යවරියන් වී අපේ මව්බිමට සේවය කරන්න. මේ වගේ ප්‍රතිඵලයක් ගැනීමට මගේ අම්මයි තාත්තයි, අපේ පාසලේ විදුහල්පතිනි නිරෝධා අබේවික්‍රම මහත්මියයි, පන්තිභාර ගුරුතුමිය වන ගංගා සුනන්දනී මහත්මියයි විශාල මඟපෙන්වීමක් කළා."

## ඉහළින්ම සමතුන් දස දෙනා අතර සිටින එකම සිසුවා මාතර රාහුලයේ සකුණ සදීශාන්



**ගන්දර සමූහ - ජයසිරි ජේදුරුආරච්චි**

ප්‍රතිඵල නිකුත් කර ඇති අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ ඉහළම දක්ෂතා දැක්වූ දස දෙනා අතරට එක්ව ඇති එකම සිසුවා වන්නේ මාතර රාහුල විද්‍යාලයේ සකුණ සදීශාන් සමරවික්‍රමය.

විභාගයට ආසන්න වෙද්දී ඩෙංගු රෝගය වැලඳීම නිසා මාතර මහ රෝහලේ නේවාසිකව සිටිමින් ප්‍රතිකාර ලබා ඇති සකුණ වෛද්‍යවරුන්ගේ උපදෙස් මත විභාග දිනට පෙර දින නිවෙසට ගොස් විවේකීව සිට පසුදා විභාගයට පෙනී සිට තිබේ.



මාතර රාහුල විද්‍යාලයේ ශිෂ්‍ය නායකයකු, කැඩෙට් කණ්ඩායමේ සහ බාලදක්ෂ කණ්ඩායමේ නිත්‍ය සාමාජිකයකු වන සකුණ විද්‍යාලයීය වෙස් නැටුම් කණ්ඩායමේ ද නිත්‍ය සාමාජිකයකු වීම විශේෂත්වයකි.

විද්‍යාලයේ බාහිර ක්‍රියාකාරකම් සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් බොහෝමයකට සම්බන්ධව සිට ඇති සකුණ පාඩම් වැඩ මෙන්ම පොතපත කියැවීමට ද මහත් කැමැත්තක් දක්වන ලදි. මිහිර, විදුසර සහ විජය පුවත්පත් කියැවීමෙන් සකුණ දැනුම එක්කරගෙන තිබේ.

පියා මාතර රාහුල විද්‍යාලයේ හිටපු විදුහල්පතිවරයා මෙන්ම වර්තමානයේ වලස්මුල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ද වන සුදත් සමරවික්‍රම මහතාය. මව වූ සුරංජි රණසිංහ මහත්මිය පෙර පාසල් ගුරුවරියක් මෙන්ම ඉංග්‍රීසි උපකාරක පන්ති ගුරුවරියක් ලෙස ද කටයුතු කරයි. එකම මල්ලී වන ඉසිර සදීශාන් ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්ව මාතර රාහුල විද්‍යාලයේ 8 ශ්‍රේණියේ ඉගෙනුම ලබයි.

වෛද්‍යවරයකු වීමේ අරමුණින් සිටින සකුණ මේ වන විටත් ජීව විද්‍යා අංශයෙන් උසස් පෙළ හදාරමින් සිටී.

## දිවයිනෙන්ම සිව්වැනි ස්ථාන 3ක් ගාල්ල සංඝමිත්තා බාලිකාවේ නදුනි ප්‍රමුදිතා





**ලංකින්ද නානායක්කාර ඉමදුව සමූහ**

"හීනයක් ද කියලත් හිතෙනවා. හීන හැබෑ කරගන්න ආසාවෙන් මහන්සි වෙලා වැඩ කළ එකේ ප්‍රතිඵලයක් කියලා හැඟෙන කොට හරිම සතුටුයි." මෙලෙස තමන්ගේ ජයග්‍රහණය ගැන පවසන්නේ මෙවර සාමාන්‍ය පෙළ විභාගයෙන් දිවයිනෙන්ම හතර වැනි ස්ථානයට පත් වූ නදුනි ප්‍රමුදිතා රණවක දියණියයි. ඇය ගාල්ල සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ බව කියන්නේ ද ආඩම්බරයෙනි.

නදුනි තම ජයග්‍රහණය ගැන මෙලෙස පැවැසුවාය.

"මගේ පාසල ගාල්ල සංඝමිත්තාව පසුගිය කාලය පුරාම ශිෂ්‍යත්වය, සාමාන්‍ය පෙළ, උසස් පෙළ සෑම විභාගයකම ප්‍රතිඵල පිට වූ විගස මුළු රටේම නම කියැවෙන පාසල වුණා. ඒ වගේ මෙවරත් මටත්, දිවයිනෙන්ම පළමු තැන ගත් මල්ෂා ඇතුළු අනෙක් සමත් හැමටමත් පාසලට ආඩම්බරයක් එක් කරන්න හැකි වුණා.

මම ශිෂ්‍යත්වයට යනකම් පාසල් ගියේ ජනාධිපති විද්‍යාලයට. ඊට පස්සේ ශිෂ්‍යත්වයට ලකුණු 182ක් අරගෙන ගාල්ල සංඝමිත්තාවට ආවා. හොඳින් පිළිවෙළකට වැඩ කළා. පළමු වසරේ ඉඳලා උගන්වපු හැම දෙනාටම ස්තූති වන්ත වෙනවා. සංඝමිත්තා විද්‍යාලයේ අපි විභාගයට මුහුණ දෙන කොට සිටි විදුහල්පතිනිය වන චාන්දනී උඩකුඹුර මහත්මිය සහ වත්මන් විදුහල්පතිනිය වන අසේනි පරණවිතාන මහත්මීන්ට විශේෂ ස්තූතිය පිරිනමනවා. මම මේ ජයග්‍රහණය ලබන්න පෞද්ගලික පන්ති ගියා. ඉතින් පාසලේ යාළුවන්, මගේ මවුපියන්, නෑදෑයන් ඇතුළු උදව් කළ හැමෝටම ස්තූතියි."

## කොළඹ විශාකා බාලිකාවේ සෙශානි සෙහංසා ජයවර්ධන



## නුගේගොඩ අනුලා විද්‍යාලයේ මෙතුකි චමෝදි පෙරේරා



## දිවයිනෙන්ම හත් වැනි තැනට පානදුර ශ්‍රී සුමංගල බාලිකාවේ තමාෂි ධනජනා වික්‍රමගේ



**පොතුපිටිය සුමිත් ප්‍රේමතිලක**



අනාගතයේ වෛද්‍යවරියක්වී රෝගීන් සුවපත් කිරීමට බලාපොරොත්තු වන බව මෙවර සාමාන්‍ය පෙළ විභාගයෙන් දිවයිනෙන්ම හත් වැනි ස්ථානය සහ කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානය පත් පානදුර ශ්‍රී සුමංගල බාලිකා විද්‍යාලයේ තමාෂී ධනජනා වික්‍රමගේ සිසුවිය පවසන්නීය.

තමා ලැබූ මේ ජයග්‍රහණය ගැන තමාෂි මෙලෙස අදහස් දැක්වීය.

"පාසලේ දෙන වැඩ එදිනෙදාම අවසන් කිරීමට කටයුතු කළා. ඉගෙනීමට අමතරව විෂය බාහිර ක්‍රියාකාරකම්වලත් නිරතව වුණා. විද්‍යා විෂයයන්වලින් ඔලිම්පියාඩ් සමස්ත ලංකා තරගාවලියේ තුන් වැනි ස්ථානය දිනාගැනීමට සමත් වුණා. මේ ජයග්‍රහණය වෙනුවෙන් විදුහල්පතිනිය වන ඉමාලී තිරිමාන්න මහත්මිය සමඟ සියලු ගුරුභවතුන් දුන් සහායට ස්තූතිවන්ත වෙනවා."

තමාෂිගේ පියා වන ඩබ්ලිව්. මහින්ද රත්න මහතා අධ්‍යාපන සේවකයන්ගේ සමූපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතියේ කොළඹ කලාප කළමනාකරු ලෙස සේවය කරන අතර, මව වන චමිලා හේවාගම මහත්මිය එම ආයතනයේම සහකාර ගණකාධිකාරීවරියක ලෙස සේවය කරයි.

සිය දියණියගේ ජයග්‍රහණය පිළිබඳ අදහස් දැක්වූ චමිලා හේවාගම මහත්මිය මෙලෙස කීවාය.

"මමයි මහත්තයයි රස්සාවට යනවා. සවස ගෙදර එනකොට දුව එයාගේ ඉස්කෝලේ වැඩ අවසන් කරලා ගෙදර වැඩත් කරලා තියනවා. දුව හොඳ ප්‍රතිඵලයක් ගනීවි කියලා විශ්වාසයක් තිබුණත් ලංකාවෙන් හත්වෙනියා වේවි කියා සිතුවේ නෑ."

තමාෂිගේ පියා වන ඩබ්ලිව්. මහින්ද රත්න මහතා ද මෙසේ පැවැසීය.

"ලොකු දුවත් පානදුර ශ්‍රී සුමංගල බාලිකාවෙන් ශිෂ්‍යත්ව සමත්වෙලා දේවි බාලිකාවේ ජීව විද්‍යා අංශයෙන් උසස් පෙළ හදාරනවා. පොඩි දුවත් හොඳ ප්‍රතිඵලයක් ගනීවි කියා බලාපොරොත්තු තිබුණා."

## අක්කත් එක්ක සාපෙළට පෙනී සිටි නංගිත් විශිෂ්ට සාමාර්ථ අරන්



**සමන් විජය බණ්ඩාර මාවනැල්ල විශේෂ**

එකම පවුලේ සහෝදරියන් දෙදෙනකු මෙවර අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් විශිෂ්ට ප්‍රතිඵල ලබා ගෙන ඇති අතර, මෙහි විශේෂත්වය වන්නේ එයින් එක් සිසුවියක් 10 වසරේ ඉගෙනුම ලබන අවස්ථාවේ විභාගයට පෙනී සිටිමින් මේ ප්‍රතිඵලය ලබාගැනීමයි.

මාවනැල්ල අධ්‍යාපන කලාපයට අයත් බදූරියා ජාතික පාසලේ ඉගෙනුම ලබන මේ සිසුවියන් දෙදෙනා වන්නේ අමිනා සුහා අසන් සහ අමිනා අසා අසාන් යන අයයි.10 වසරේ ඉගෙනුම ලබන අමිනා සුහා අසන්ට වයස අවුරුදු 15ක් වන අතර, ඇයගේ අක්කා වන අමිනා අසා අසාන්ට වයස අවුරුදු 17කි. ඉංග්‍රීසි භාෂාවෙන් විභාගයට පෙනී සිට ඇති මේ සිසුවියන් දෙදෙනාම සිංහල භාෂාවට ඒ සාමාර්ථයක් ගැනීම විශේෂත්වයකි.

මේ ප්‍රතිඵල හේතුවෙන් සතුටට පත්ව සිටින ඔවුන්ගේ මව වන එස්. මුස්නි මහත්මිය මෙලෙස අදහස් දැක්වීය.



අමිනා සුහා අසන්



අමිනා අසා අසාන්

"10 වසරේ ඉගෙන ගන්න දියණියට තිබුණු ආසාව නිසා එයා කලින්ම විභාගයට පෙනී සිටියා. මට දියණියන් තුන් දෙනෙක් ඉන්නවා. බාලම දියණියට වයස අවුරුදු 06යි. මේ තුන්දෙනාම මුලින්ම කළුතර තමා ඉස්කෝලෙ ගියේ. 2017දී අපි මාවනැල්ලේ පදිංචියට ආවා. පස්සෙ බදූරියා ඉස්කෝලෙට දරුවන් ඇතුළත් කර ගත්තා. මගේ මහත්තයා විදේශගතව රැකියාවක් කරනවා. මේ ප්‍රතිඵල අහලා එයා ගොඩක් සතුටු වුණා."

දියණියන් දෙදෙනාගේ අනාගත බලාපොරොත්තුව වෛද්‍යවරියන් ලෙස රටට සේවයක් කිරීමයි. පාසලේ පැවැත්වෙන ඉංග්‍රීසි දිනය, බාලදක්ෂ ක්‍රියාකාරකම් මෙන්ම අන්තර්ජාලයේ විවිධ ක්‍රියාවලදී මේ දෙදෙනා දක්ෂතා පෙන්වා ඇත.

ලැබූ විශිෂ්ට ප්‍රතිඵල ගැන මේ සිසුවියන් දෙදෙනා අදහස් දක්වන්නේ මෙලෙසිනි.

"පාසල් කාලයෙන් පසුව පැය තුනකට වඩා වැඩි කාලයක් කාල සටහන් යොදාගෙන මේ විශිෂ්ට ප්‍රතිඵලය වෙනුවෙන් පාඩම් කළා. ඒ වෙනුවෙන් අමතර පන්තිවලටත් සහභාගි වුණා. අපි දෙන්නාට අපහසු විෂය කරුණු අපි දෙන්නාම එකතුවෙලා සාකච්ඡා කර විසඳුම් සෙව්වා. මේ ප්‍රතිඵලය ලබන්න එයත් හේතු වුණා. මේ ප්‍රතිඵලය ගන්න අපව දිරිගැන්වූ පාසලේ විදුහල්පතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයටත්, පවුලේ ඥාතීන් ඇතුළු සියලු දෙනාටත් ස්තූතිය පුද කරනවා."